**ශීර්ෂය 300, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව**

**------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 25 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුලි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රීලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අයවැය ඇස්තමේන්තුව අනුව රු.570,950,000 ක මුළු වියදම දේශිය අරමුදල් (11) මගින් රු.549,950,000 ක්ද, විදේශීය මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය (17) මගින් රු.21,000,000 ක්ද වශයෙන් මූල්‍යකරණය කර තිබුණද ACA 2(IV) හා ACA 2 (V) ආකෘතියෙහි සම්පූර්ණ වියදම දේශිය අරමුදල් (11) මගින් මූල්‍යකරණය කර ඇති බව දක්වා තිබුණි. | වැරදිමකින් එම මුළු වියදම දේශිය අරමුදලේ (ii)වෙත සටහන් වි ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | වෙනත් යන්ත්‍ර උපකරණ යටතේ වර්ෂය තුල මිල දී ගත් රු.682,120 ක මිලදී ගැනීම් භාණ්ඩාගාර මුද්‍රිතයන්හි (SA 82) ඇතුලත්ව නොතිබුණි. | 2021 වර්ෂය තුළ මිලදී ගත් පරිඝණක උපකරණ නියමිත පරිදි CIGAS වැඩසටහනට ඇතුළත් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (ඇ) | අනෙකුත් ආදායම් ශිර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම රු186,604,076 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණු අතර අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරන ආයතනය විසින් දරන ලද වියදම රු.14,075,525 ක් වුවද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එය රු.198,689 ක් ලෙස දක්වා තිබුණි. | එකඟ වන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (ඈ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7.2 ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුලත් | එය නිවැරදිකර ඉදිරිපත් කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

නොකල යුතු වුවද වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද රු.186,604,076 ක් මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශයේ වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් යටතේ දක්වා තිබූ අතර රු.5,337,146 ක අගය වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම ලෙස දක්වා තිබුණි.

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපළ පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව (SA 82) බඩු ගබඩාව සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය රු.3,489,301,978 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස රු.3,616,601,978 ක් දක්වා තිබීමෙන් රු.127,300,000 ක් වැඩිපුර දක්වා තිබුණි. එලෙස වැඩියෙන් දැක් වූ රු.127,300,000 අපහරණ ලෙස දක්වා තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුල එවැනි අපහරණයන් වූ බවට සාක්ෂි අනාවරණය නොවීය | 2021 වර්ෂයේ බඩු ගබඩා සම්බන්ධව කිසිදු වෙනසක් සිදු නොවූ අතර SA82 වාර්තා වල 2020 වාර්තා වූ තොරතුරු 2021 වර්ෂයේ ද වාර්තා වී ඇති බව දන්වා තිබුණි. | නිවැරදිව තොරතුරු ගිණුම් වලින් අනාවරණය කිරීමට ක්‍රියාකල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයක් හා මූලධන වැය විෂයයක් සඳහා සලසා තිබූ රු.4,000,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | කොවිඩ් තත්වයන් සමග දෙපාර්තමේන්තුවේ අත්‍යවශ්‍ය ගබඩා පමණක් අළුත්වැඩියා කිරීමට ප්‍රමුඛතාවය දීමත් වාහන අළුත්වැඩියා කටයුතු කල් දැමීමත් හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | වාර්ෂික ඇස්තමේන්තු මගින් අධි ප්‍රතිපාදන සලසා ගැනීම පාලනය කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූලධන වැය විෂයන් 02 ක් සඳහා එකතු වටිනාකම රු.1,800,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,547,651 ක ඉතිරියක් පැවතුණ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 ත් සියයට 98 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වැය විෂයන්වල අත්‍යවශ්‍ය කටයුතු පමණක් ඉටුකිරීම නිසා මෙලෙස ප්‍රතිපාදන ඉතිරිවී ඇත. | වාර්ෂික ඇස්තමේන්තු මගින් අධි ප්‍රතිපාදන සලසා ගැනීම පාලනය කල යුතුය. |
| (ඇ) | වැය විෂයයන් 06 කට ලබා දී තිබූ ප්‍රතිපාදන අතිරික්ත හා ඌණ වීම මත වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබූ අතර 1101 සහ 1402 වැය විෂයයන් වෙත මු.රෙ.66 මඟින් මාරු කර තිබූ ප්‍රතිපාදනයන්ගෙන් වර්ෂය අවසානය වන විට පිළිවෙලින් සියයට 88 ක් සහ සියයට 64 ක් ඉතිරි වී තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වී තිබුණි. | මු 66.රෙ.මාරු කිරීම් සිදු කිරීමේදී අවශ්‍යතාවය සලකා බලා මාරු කිරීම් සිදුකල යුතුය. |
| (ඈ) | 1003 වෙනත් දීමනා වෙනුවෙන් සලසා තිබූ රු.17,000,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු.4,375,000 ක් වූ සියයට 26 ක් වෙනත් වැය විෂයයන් වෙනුවෙන් මාරු කිරීමෙන් පසුව ද වර්ෂ අවසානය වන විට රු.2,452,865 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයට සාපේක්ෂව සියයට 40 ක මාරු කිරීම් හා ඉතිරිය පැවතීමෙන් නිසි පරිදි ඇස්තමේන්තු සකස් කර නොමැති බව නිරීක්ෂණය විය. | ඇස්තමේන්තු සකස් කිරීමේදි අනුමත කාර්යමණ්ඩලය පදනම් කරගෙන සකස් කළ බැවින් අධි ප්‍රතිපාදන ඇස්තමේන්තු සකස් වී ඇත. | තාත්වික ඇස්තමේන්තු සකස් කිරීමට වගබලා ගත යුතුය. |
| (ඉ) | 1101 දේශීය ගමන් වියදම් වැය විෂයයට අයවැය ඇස්තමේන්තුව මඟින් රු.250,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර මු.රෙ.66 මාරු කිරීම යටතේ රු.1,000,000 ක අමතර ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 70 ක් ඉතිරි වීමට හේතුව මු.රෙ.66 මාරු කිරීමේදී ඇස්තමේන්තු කල මුදලට වඩා වැඩි අගයක් ලැබීම ලෙස දක්වා තිබුණ ද මු.රෙ.66 අනුව අයදුම් කිරීමේදී රු.1,000,000 ක අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබුණි. | ඌණ ප්‍රතිපාදන මාරු කිරීමේදි 100000 ක අවශ්‍යතාවය 1000000 ලෙස දැක්වීම නිසා එම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මු 66.රෙ.මාරු කිරීම් සිදු කිරීමේදී අවශ්‍යතාවය සලකා බලා මාරු කිරීම් සිදුකල යුතුය. |

**2.2** බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** මුදල් රෙගුලාසි 215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන නොතිබියදී මූල්‍ය ප්‍රකාශනවල සටහන (V) යටතේ එකතුව රු.2,259,528 ක් වූ බැරකම් පවතින ලෙස සටහන් කර තිබුණි. | එය නැවත නිවැරදිකර පිළිතුරු සමග ඉදිරිපත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට වගබලා ගත යුතුයි. |
| **(ආ)** ගමන් වියදම්,අතිකාල,නිවාඩු දින වැටුප් සහ වැඩ බැලීමේ දීමනා වලට අදාල රු.236,563 ක් මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැදීම් ප්‍රකාශය සටහන iv යටතේ දක්වා තිබුණි. තවද මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැදීම් ප්‍රකාශයේ (සටහන iv) දක්වා තිබු වාර්ෂික පුනරාවර්තනය වන සේවාවන් හෝ සැපයුම් සඳහා වූ ගෙවීම් වලට අදාල එකතුව රු.2,022,965 ක් සටහන ( iii) යටතේ වූ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි. | එය නැවත නිවැරදි කර පිළිතුරු සමග ඉදිරිපත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට වගබලාගත යුතුය. |
| **(ඇ)** සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු වරිපනම් රු.301,138 ක් 2022 වර්ෂයේ දී ගෙවා තිබුණ ද, එම මුදල බැරකම් ලෙස දක්වා නොතිබුණි. | රු.301,138 ට අදාළ වරිපනම් ඇස්තමේන්තු අදාළ කාළය තුළ ලැබී නොතිබුණි. එබැවින් එය දෙසැම්බර් 31 දිනට බැදිම් හා බැරකම් ප්‍රකාශයේ සඳහන් කොට නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට වගබලා ගත යුතුයි. |

## 2.3 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **වටිනාකම (රු.)** | **අනුකූල නොවීම** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 571 | 19,945,778 | වසර 02 ඉක්ම වූ එකතුව රු.19,945,778 ක තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.571 ක පරිදි කටයුතු කර නොතිබුණි. ඒ තුල වසර 10 ඉක්ම වූ රු.5,816,443 ක ශේෂයක් ද වසර 5 ත් 10 ත් අතර වූ රු.7,728,263 ක ශේෂයක් ද විය. | 2021 දෙසැම්බර් 31 දිනට වූ පොදු තැන්පතු ශේෂයන්හි අවු. 2 ඉක්ම වූ තැන්පතු ශේෂයන් අතර, දැනටමත් කුලී පදනම මත භාවිතා කරන ගබඩා සහ නිවාස සඳහා වන තැන්පතු ශේෂයන් ඇතුළත්ව ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) | 2021 ඔක්තෝම්බර් 26 දිනැති අංක 2021/02 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 4.5 ඡේදය | 457,216 | සමාලෝචිත වර්ෂය තුල ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්වලින් හෙළිදරව් නොකළ රු.457,216 ක බැරකම් 2022 වර්ෂයේ ජනවාරි මස තුල පියවා තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා තොරතුරු රැස් කිරීමේදි 2022 ජනවාරි මස අවසන් වන තෙක් පමණක් බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය සඳහා තොරතුරු ලබා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2.4 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 පෙබරවාරි 10 දින සිට 2021 දෙසැම්බර් 27 දින දක්වා ගිණුමකට සෘජුවම බැර කර තිබූ රු.580,718 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනා නොගත් ලැබීම් සඳහා තහවුරු කිරීම් මෙතෙක් ලැබී නොතිබුණු අතර හඳුනාගත හැකි ලැබීම් කළ පුද්ගලයන් සහ ආයතන දැනුවත් කර තහවුරු ලබා ගැනීමට කටයුතු සිදුවෙමින් පවතී . | හඳුනානොගත් ලැබීම් නොපමාව තහවුරු කරගෙන ගිණුම්ගත කිරීම කඩිනමින් සිදුකල යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව "ආරක්ෂිතව අඛණ්ඩව, පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සෑම නිවසකටම" යන දැක්ම අනුව ක්‍රියාත්මක වන අතර ඒ යටතේ,<br>(අ) දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ (SAARC) කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙ.ටො.8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.<br>(ආ) 2008 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දිවයින පුරා පවතින ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙ.ටො.100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.<br>ප්‍රධාන කාර්යයන් ලෙස හඳුනාගෙන තිබුණ ද 2021 වර්ෂය තුල දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ සහල් සඳහා රජය විසින් පාලන මිලක් පැනවූ අතර පසුව රජය විසින් එම පාලන මිල ඉවත් කිරීමත් සමඟ දේශීය වෙළඳපල තුළ සීඝ්‍ර සහල් මිල ඉහළ යාමක් සිදු විය. මෙයට පිළිතුරක් ලෙස සහල් ආනයනය සඳහා යෝජනා වූ අතර, ආරක්ෂිත සහල් තොගයක් තබා ගැනීම සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ රු. මිලියන 200 ක ප්‍රතිපාදන, රාජ්‍ය වානිජ නීතිගත සංස්ථාව මඟින් සහල් ආනයනය කරවා සතොස හරහා රට පුරා බෙදා හැරීම සඳහා රාජ්‍ය වානිජ නීතිගත සංස්ථාව වෙත ලබා දෙන ලදි.ඒ තුළින් රට තුළ සහල් සුලභතාවය ඇතිකර සහල් මිල පාලනය අපේක්ෂා කරන ලදි. | ආයතනයේ දැක්ම සහ ප්‍රධාන අරමුණු ඉටු කරගැනීමට අදාල කටයුතු නොපමාව ක්‍රියාත්මක කල යුතුයි. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සතු වත්කම් අවසන් වරට 2019 වර්ෂයේදී තක්සේරු කර තිබූ අතර දිස්ත්‍රික්ක 10 ක ඉඩම් සහ ගබඩා 96 ක් තක්සේරු කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට දිස්ත්‍රික්ක 15 ක ඉඩම් සහ ගොඩනැඟිලි 28 ක් තවදුරටත් තක්සේරු කිරීමට පැවතුණි. | 2020 හා 2021 වර්ෂ වලදී රටේ පැවති COVID-19 වසංගත තත්ත්වය සහ සංචරණ සීමා හේතු කොට ගෙන වත්කම් තක්සේරු කිරීමට නොහැකි විය. මෙම වසරේදී අදාළ තක්සේරු කටයුතු කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | තක්සේරු ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාකල යුතුය. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාඩු හා අත්හැරීම් තුල දීර්ඝ කාලයක සිට පැවත එන ශේෂයන් සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණයක් කර ප්‍රාරම්භක වාර්තා හා පූර්ණ වාර්තාවන් ලබාගෙන අදාල මුදල අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුමේ දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අතර පෙර වර්ෂ වල සිට පැවත එන රු.332,250 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂවල සිට පැවත එන මෙම වෙනස හඳුනා ගැනීමට උත්සහ කරන අතර මෙතෙක් ප්‍රතිඵල සොයාගත නොහැකි වී ඇත. හැකිතාක් දුරට මෙම වෙනස සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරමින් පවති. | වෙනස හඳුනා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මියගිය නිලධාරීන්ගෙන්, විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන්, සේවය අත්හිටු වූ හා සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.1,697,190 ක ණය අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | මියගිය නිළධාරින්ගේ විශ්‍රාම ගිය නිළධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ සම්බන්ධයෙන් එම නිළධාරින්ගේ තොරතුරු සොයගත නොහැකි වීම මත ඉදිරියේදි පොත්වලින් ලියා හැරිමට කටයුතු කරමින් පවති.<br>2020 වසරේ විශ්‍රාම ගිය නිළධාරින් 06 දෙනෙකුගේ ණය ශේෂ මේ වන විට නිරවුල් කර ඇති අතර වසරකට අඩු ණය ශේෂ පවතින විශ්‍රාම ගිය නිළධාරියෙකුගේ ණය ශේෂය මෙම වසරේදි නිරවුල් කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.<br>වසරකට අඩු හිග ණය ශේෂ පවතින වැඩ තහනම් කළ සහ සේවය අතහැර ගිය නිළධාරින්ගේ හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා ඔවුන්ගේ වර්තමාන තතත්වය පිළිබද පාලන අංශය වෙතින් තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවති. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර පැරණි ණය ශේෂ නිරවුල් කළ යුතුවේ. |
| (ඇ) | දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ (SAARC) කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව දකුණු ආසියාතික කලාපීය රටවල හදිසි ආපදා සංචිතයක් ශ්‍රී ලංකාව තුල පවත්වාගෙන යා යුතුව තිබුණි. එය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස හඳුනාගෙන තිබූ අතර 2021 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම තුල රු.මි. 200ක් ඒ වෙනුවෙන් ඇස්තමේන්තු කර තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් එම කටයුතු සිදු කර නොතිබුණු අතර වෙන් කර තිබූ ප්‍රතිපාදන සහල් ආනයනය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව (STC) වෙත මාරු කර යවා තිබුණි. | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත රාජ්‍ය වාණිජ විවිධ නිතිගත සංස්ථාව මගින් සහල් මෙ.ටො.50,000 ක් ආනයනය කර, දෙපාර්තමේන්තුවේ වේයන්ගොඩ ගබඩාවේ ගබඩා කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. | ආයතනය පිහිටුවිමේ අරමුණු අනුව කාර්යයන් ඉටු කිරීමට වගබලා ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | දෙපාර්තමේන්තුව සතුව මෙ.ටො.223415 ක ධාරිතාවයෙන් යුතු ගබඩා 93 ක් පැවති අතර ඉන් ගබඩා ධාරිතාවය මෙ.ටොන් 180,895 ක් වූ ගබඩා 75 ක් බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණි. ඉන් ගබඩා 55 ක් සම්බන්ධයෙන් බදුකරුවන් 24 දෙනෙකුගෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.63,955,810 ක බදු මුදලක් ලැබිය යුතුව පැවතුණි. | 2022 අප්‍රේල් 30 දින වන විට රු.44,070,840 ක කුලී මුදල් ලැබී ඇති අතර නිසි පරිදි ගෙවීම් සිදු කර නොමැති අය සඳහා 2022 ජූනි 30 දිනට පෙරට ගෙවීම් සිදු කරන ලෙස දැනුම් දී ඇත. | නියමිත දිනට බදු කුලී අයකර ගැනීමට ක්‍රියාකල යුතුයි. |
| (ඉ) | දෙපාර්තමේන්තුව සතු ගබඩාවන්ගෙන් 16 ක් පමණක් දෙපාර්තමේන්තුව භාරයේ පැවති අතර 2021 වර්ෂයේ ඒවායෙහි සහල් ගබඩා කිරීමක් සිදු කර නොතිබුණි. තවද ඉන් හම්බන්තොට ගබඩාව නවීකරණය වෙනුවෙන් වර්ෂය තුල රු.16,822,621 ක වියදමක් දරා තිබුණි. | දකුණු පළාත තුල විශාල වශයෙන් වී නිෂ්පාදන වනුයේ හම්බන්තොට දිස්ත්‍රික්කයෙනි. එබැවින් එම ගබඩාව නවීකරණය කර භාවිතයට ගන්නා ලෙස එවකට වූ කෘෂිකර්ම ඇමතිතුමාගේ ඉල්ලීම පරිදි ගබඩාව අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර ඇත. | දෙපාර්තමේන්තුව සතු ගබඩා නිෂ්කාර්යව නොපැවතීමට වගබලාගත යුතු අතර,දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව සඳහා ප්‍රයෝජනයට නොගනී නම්, වෙනත් පාර්ශවයන් වෙත බදු දීමෙන් ආදායම් උපයා ගැනීමට හෝ කටයුතු කල යුතුය. |
| (ඊ) | දෙපාර්තමේන්තුව සතු ගබඩා ධාරිතාවය මෙ.ටොන් 3655 ක් වූ වවුනියාව හා කඳුරුවෙල ගබඩා දෙක අත්හැර දමා තිබුණු අතර ඒ වෙනුවෙන් ලිපිගොනු විගණනය වෙත ඉදිරිපත් නොවිණි. එම ගබඩා සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක්ද සිදුකර නොතිබුණි. | 2012 න් පසු මෙම ගබඩා දෙක භාවිතා කර නොතිබුණු අතර නවීකරණය කළ යුතු මට්ටමක පවතින බැවින් 2023 අයවැය ප්‍රතිපාදන මඟින් නවීකරණය කර ප්‍රයෝජනයට ගැනීමට සැලසුම් කර ඇත. | රජයේ මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි කළමනාකරණය කර උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ප්‍රයෝජනයට ගැනීමට වගබලා ගත යුතුය. |
| (උ) | වේයන්ගොඩ විද්‍යාත්මක ගබඩාව සම්බන්ධයෙන් 2012/2013 වර්ෂයන් හි සහල් මෝල් හිමියන් සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව එක් සහල් මෝල් හිමියෙකුගෙන් ලැබිය යුතු රු.6,102,932 ක් වූ මුදල 2022 පෙබරවාරි 15 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | ආහාර දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතු රු.6,102,932 ක මුදල් අය කර ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතු යොදා ඇත. | හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාකල යුතුයි. |
| (ඌ) | දෙපාර්තමේන්තුව භාරයේ පවතින සියලුම ගබඩාවන්හි විදුලි බිල්පත් ගෙවීම් පිළිබඳ ලේඛන දෙපාර්තමේන්තුව සතුව නොමැති අතර කුලියට ලබා දී ඇති ගබඩා කුලී | දෙපාර්තමේන්තුව භාරයේ පවතින ගබඩා අතරින් බොහොමයක් ගබඩා, කුලී පදනම මත පෞද්ගලික ආයතන වෙත ගිවිසුම් ගතව | දෙපාර්තමේන්තුවට අයත් ගබඩා වල බිල්පත් පියවීමට අදාල විස්තර ආයතනය තුල තබා ගැනීමට ක්‍රියාකල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපූර්ණය කරන ගබඩා 07 ක් සම්බන්ධව පමණක් ලේඛන පවත්වාගෙන ගොස් තිබුණි. ඉන් ගබඩා 06 ක් සම්බන්ධව 2021 වර්ෂය වෙනුවෙන් රු.8,082,214 ක විදුලි බිල්පත් හා රු.275,094 ක ජල බිල්පත් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | ලබා දී ඇති අතර එම ගබඩාවලට අදාල විදුලි බිල්පත් එම ආයතනය විසින්ම නිසියාකරව ගෙවීම් කටයුතු සිදු කරයි. එබැවින් එම විදුලි බිල්පත් ගෙවීම් පිළිබඳ ලේඛන නොමැති බව දන්වා තිබුණි. | |
| (එ) | දෙපාර්තමේන්තුව සතුව පවතින ගබඩා සඳහා දෙපාර්තමේන්තුව විසින් නවීකරණය, ජලය, විදුලිය, සේවක පඩි නඩි වෙනුවෙන් වියදම් දරනු ලබයි. නමුත් එක් එක් ගබඩාව වෙනුවෙන් දැරූ මුළු වියදම පිළිබඳ ඍජුව හඳුනාගත හැකි ලේඛන ආයතනය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් ගබඩා පාලනය සඳහා එවැනි අභ්‍යන්තර පාලන ක්‍රමයක් හඳුනාගෙන නොතිබුණි. | ආයතනය සතුව සීමිත සේවක සංඛ්‍යාවක් සේවය කරනු ලබයි. අප දෙපාර්තමේන්තුව සතුව පවතින ගබඩාවන්හි ඵලදායිතාවය කාර්යෂමතාවය ඉහල නැංවීමට කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ අරමුණු වේ. කෙසේ වුවද භාණ්ඩාගාර ප්‍රතිපාදන මත නවීකරණය, ජලය, විදුලිය, සේවක පඩිනඩි සඳහා ගෙවීම් කරනු ලබන අතර ඒ අනුව දරන ලද වියදම් පිළිබඳ වාර්තා දෙපාර්තමේන්තුව සතුව ඇත. | නිසි අභ්‍යන්තර පාලන ක්‍රමයක් හඳුන්වා දීමට ක්‍රියාකල යුතුයි. |

## 4. තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් 2030 වන විට කුසගින්න අවසන් කිරීම යන තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන තිබුණු අතර ඒ යටතේ ,<br>• ආහාර මිල උච්ඡාවචනය වැළැක්වීම<br>• ආහාර සංචිත පවත්වා ගැනීම<br>යන ඉලක්ක කෙරෙහි අවදානය යොමුව තිබුණ ද 2021 වර්ෂය වන විට ද ගබඩාවන් ඉදි කිරීම කෙරෙහි පමණක් අවදානය යොමු කර තිබු අතර එම ගබඩාවන්හි ආහාර දෙපාර්තමේන්තුව සතු කිසිදු ආහාර සංචිතයක් නොතිබුණි. | එකඟ වේ. | අරමුණු ඉටු කිරීම කෙරෙහි අවධානය යොමු කල යුතුය. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40.2 වගන්තිය අනුව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේනතුව සතුව අභ්‍යන්තර විගණන අංශයක් නොපවතින බව දන්වා තිබුණි. | පනත අනුව ක්‍රියා කිරීමට වගබලා ගත යුතුයි. |

### 5.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන කළමනාකරණ කමිටු පත් කර නොතිබුණි. | දෙපාර්තමේනතුව සතුව ආදායම් ශීර්ෂයක් හෝ අභ්‍යන්තර විගණන අංශයක් නොපවතින බැවින්, දෙපාර්තමේන්තු මට්ටමින් විගණන කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට හැකියාවක් නොපවතින බව දන්වා තිබුණි. | පනත අනුව ක්‍රියා කිරීමට වගබලා ගත යුතුයි. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 214 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 105 ක් වූයෙන් සේවක පුරප්පාඩු 109 ක් පැවතිණි. | පුරප්පාඩුව පිරවීමට කටයුතු කරන ලෙස රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාළන අමාතයාංශයේ ලේකම් වෙතින් සහ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඉල්ලීමක් කර ඇති බව. | පුරප්පාඩු පිරිවීමට ක්‍රියාකල යුතුයි. |